# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2025 සැප්තැම්බර් මස 12 වන දින
## II වන කොටස
## අතිරේකය

(2025.09.18 දින නිකුත් කරන ලදී)


# ගෙවල් කුලී (ඉවත් කිරීමේ)

**1972 අංක 7 දරන ගෙවල් කුලී පනත ඉවත් කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : රු. 29.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

එල්.ඩී.-ඕ. 77/2023

## 1972 අංක 7 දරන ගෙවල් කුලී පනත ඉවත් කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2025 අංක දරන ගෙවල් කුලී (ඉවත් කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වන ව්‍යවස්ථාව ප්‍රකාරව මේ පනත සම්බන්ධයෙන් සහතිකය සටහන් කරනු ලබන (මේ පනතේ "අදාළ දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දින සිට ක්‍රියාත්මක විය යුතු ය. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය

**2.** 1972 අංක 7 දරන ගෙවල් කුලී පනත මෙයින් ඉවත් කරනු ලැබේ. 1972 අංක 7 දරන පනත ඉවත් කිරීම

**3.** (මේ වගන්තියේ "ඉවත් කරන ලද පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 1972 අංක 7 දරන ගෙවල් කුලී පනත, මේ පනතේ 2 වන වගන්තිය මගින් ඉවත් කරනු ලැබුව ද - ඉතිරි කිරීම් සහ අන්තර්කාලීන විධිවිධාන

(අ) අදාළ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඉවත් කරන ලද පනතේ විධිවිධාන මගින් පාලනය වන යම් ස්ථානයක සන්තකය දරන කුලී නිවැසියකු නෙරපීම සඳහා අදාළ දිනයේ සිට අවුරුදු එකක කාලසීමාවක් දක්වා කිසිදු නඩුවක් පවරනු නොලැබිය යුතු ය;

(ආ) අදාළ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඉවත් කරන ලද පනතේ විධිවිධාන මගින් පාලනය වන යම් ස්ථානයක කවර හෝ ගෙහිමියකු විසින්, අදාළ දිනයේ සිට අවුරුදු එකක කාලසීමාවක් දක්වා, ඉවත් කරන ලද පනත යටතේ ගෙවිය යුතු නියමිත ගෙවල් කුලිය ඉක්මවන යම් කුලී මුදලක් ඉල්ලා සිටීම හෝ ලබා ගැනීම නොකළ යුතු ය;

(ඇ) ඉවත් කරන ලද පනත යටතේ කරන ලද හෝ නොකර හරින ලද යම් ක්‍රියාවක් හෝ දෙයක් හෝ ඉවත් කරන ලද පනත යටතේ අත්කර ගන්නා ලද යම් අයිතිවාසිකමක් හෝ හිමිකමක් අදාළ දිනයේ

සිට අවුරුදු එකක කාලසීමාවක් සඳහා වලංගු ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඈ) ඉවත් කරන ලද පනතේ 38 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ගෙවල් කුලී මණ්ඩලය ඉදිරියෙහි ගොනු කරන ලදුව හෝ ආරම්භ කරන ලදුව, අදාළ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී විභාග වෙමින් පවතින හෝ කටයුතු අවසන් නොවී පවතින යම් ඉල්ලීමක් හෝ නඩුකටයුත්තක් අදාළ දිනයේ සිට අවුරුදු එකක කාලසීමාවක් ඇතුළත ඉදිරියට පවත්වාගෙන ගොස් අවසන් කරනු ලැබිය යුතු ය;

(ඉ) ඉවත් කරන ලද පනතේ 40 වන වගන්තිය යටතේ පිහිටුවන ලද සමාලෝචන මණ්ඩලය ඉදිරියේ ගොනු කරන ලදුව හෝ ආරම්භ කරන ලදුව, අදාළ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී විභාග වෙමින් පවතින හෝ කටයුතු අවසන් නොවී පවතින යම් ඉල්ලීමක් හෝ නඩුකටයුත්තක් අදාළ දිනයේ සිට අවුරුදු එකක කාලසීමාවක් ඇතුළත ඉදිරියට පවත්වාගෙන ගොස් අවසන් කරනු ලැබිය යුතු ය;

(ඊ) ඉවත් කරන ලද පනත යටතේ ජාතික නිවාස කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරන ලදුව අදාළ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඔහු ඉදිරියෙහි විභාග වෙමින් පවතින යම් ඉල්ලීමක් එම පනත ඉවත් කර නොමැති ලෙස සලකා ඉදිරියට පවත්වාගෙන ගොස් අවසන් කරනු ලැබිය යුතු ය; සහ

(උ) ඉවත් කරන ලද පනත යටතේ ආරම්භ කරන ලදුව, අදාළ දිනයට පෙරාතුවම වූ දිනයේ දී විභාග වෙමින් පවතින හෝ කටයුතු අවසන් නොවී පවතින යම් නඩුවක් හෝ නඩුකටයුත්තක් හෝ දෙයක්, තත්කාලයේ බලපවත්නා වෙනත් යම් නීතියක් යටතේ එම සමාන සහනය ම ලබා ගැනීම අපේක්ෂාවෙන් අලුත් නඩුවක් ගොනු කිරීමේ නිදහස ඇතිව ඉල්ලා අස්කර ගනු ලැබිය හැකි ය. ඒ අලුත් නඩුව අදාළ දිනයේ සිට අවුරුදු එකක කාලසීමාවක් ඇතුළත ගොනු කරනු ලැබිය යුතු ය.

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව